People’s Action for Free & fair Election (PAFFREL)

| ළමා ආරක්ෂණ ප්‍රතිපත්තිය | ප්‍රතිපත්ති අංකය: |
|---|---|
| අනුමත කළේ : අධ්‍යක්ෂ මණ්ඩලය | |
| අනුමත කළ දිනය: | |
| සමාලෝචනය / පසුවිපරම් සිදු කරන දිනය: වසර 3කට වරක් හෝ අවශ්‍ය වූ ඕනෑම මොහොතක | |
| භාෂා මාධ්‍යය: සිංහල / දෙමළ / ඉංග්‍රීසි | |
| අදාළ පුද්ගලයන්/ පාර්ශවයන් : පැෆ්රල් කාර්ය මණ්ඩලයට සෘජු ව හෝ වක්‍රව සම්බන්ධ වන පිරිස් | |

## අරමුණ/ ඉලක්කය

නිදහස් හා සාධාරණ මැතිවරණයක් සඳහා වූ ජනතා ක්‍රියාකාරිත්වයේ (පැෆ්රල් ) ළමා ආරක්‍ෂණ ප්‍රතිපත්තියේ සමස්ත අරමුණ වන්නේ පැෆ්රල් සංවිධානය හා එහි හවුල්කාර/ පාර්ශවකාර ජාලයන් ඇතුළත් පරිසරය තුළ සේවය කරන ළමයින් සඳහා සුරක්ෂිත අවකාශයක් නිර්මාණය කිරීම සහ සියලුම ළමයින්ගේ සාධාරණ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමට හේතුවන හිතකර පරිසරයක් නිර්මාණය කිරීමට දායක වීමයි.

## ළමා ආරක්ෂණ ප්‍රතිපත්ති ප්‍රකාශය/ ප්‍රකාශනය

ළමයාගේ යහපත උපරිමයෙන් සහතික කරන ප්‍රධාන මාර්ගෝපදේශන මූලධර්ම හතරක් මෙම ළමා ආරක්‍ෂණ ප්‍රතිපත්තියේ අඩංගු වේ. එනම් ,ළමා හිංසනය මුළුමනින්ම පිටුදැකීම, ළමා අයිතිවාසිකම් පිළිගැනීම, ළමා ආරක්‍ෂණය පිළිබඳ වගකීම බාර ගැනීම සහ අසාධාරණ හේතු මත ළමයින්ට කිසිවිටෙක වෙනස් කොට නොසැලකීම.

පැෆ්රල් සංවිධානය ලිංගික හිංසනය ඇතුළු සියලුම ආකාරයේ ළමා අපයෝජන මුළුමනින්ම පිටුදකිනු ලබයි. ළමුන් කෙරෙහි පිළිගත නොහැකි අවදානමක් ඇති කරන ඕනෑම පුද්ගලයෙකු, ළමා කාමුක දර්ශන සන්තකයේ තබාගෙන සිටින හෝ එවැනි දශර්නවලට ප්‍රවේශ විය හැකි ඕනෑම අයෙකු පූර්ව දැනුම් දීමකින් තොරව ක්‍ෂණිකව සේවයෙන් පහ කිරීමට පියවර ගනු ලබන අතර, ඉන් අනතුරුව එවැනි පුද්ගලයන්ට එරෙහිව අපරාධ නීතිය යටතේ ක්‍රියා කරනු ඇත.එමෙන්ම, කාර්ය මණ්ඩලයේ පාවිච්චිය සඳහා වෙන් කර ඇති සියළුම පරිගණකවල ඓතිහාසික ක්‍රියාකාරකම් පූර්ව දැනුම් දීමකින් තොරව පරීක්ෂා කිරීමේ අයිතිය පැෆ්රල් සංවිධානයේ කළමනාකාරිත්වය සතු වේ.

එමෙන්ම,පැෆ්රල් සංවිධානයේ ළමා ආරක්ෂණ ප්‍රතිපත්තිය සහ ළමා අපයෝජනයන් හා ළමා අයිතිවාසිකම් උල්ලංඝනය කිරීම් සම්බන්ධයෙන් වාර්තා / පැමිණිලි කළ යුතු පුද්ගලයන්ගේ තොරතුරු පිළිබඳව ආයතනයේ ක්ෂේත්‍රීය ප්‍රතිලාභීන් ද දැනුවත් කරනු ලැබේ. ළමා ආරක්ෂණ ප්‍රතිපත්තිය දැඩි ලෙස ක්‍රියාත්මක කරන අතර එය කළමනාකරණය විසින් ආශ්‍රිත පුහුණු මාගෙර්ාපදේශනය (associated practice guidance) ඔස්සේ විශේෂයෙන්ම ළමයින් සම්බන්ධ වැඩ සටහන් ක්‍රියාත්මක කිරීමේදී දැඩි අධීක්ෂණයට භාජනය කරනු ලැබේ.

## ළමා ආරක්ෂාව සඳහා කැපවීම

රාජකාරී කටයුතු සඳහා හෝ පවුලේ සාමාජිකයන් වශයෙන් හෝ පැෆ්රල් සංවිධානයට පැමිණෙන සියලුම ළමයින්ට, තමන් සුරක්ෂිත බව හැඟීමට මෙන්ම සුරක්ෂිතභාවය අත්දැකීමට / භුක්ති විඳීමට අයිතියක් ඇත. පැෆ්රල් සංවිධානයේ සේවාවන් ලබා ගැනීම පිණිස අප වෙත පැමිණෙන සියලුම ළමයින්ගේ හා තරුණයින්ගේ ආරක්ෂාව සහ යහපැවැත්ම සහතික කිරීමට පැෆ්රල් සංවිධානය කැපවී සිටින අතර, අප විසින් රැකබලා ගන්නා ළමයින්ගේ සුබසාධනය සැලසීම සැමවිටම අපගේ පළමු ප්‍රමුඛතාවය වේ. එය පැෆ්රල් සංවිධානයට සම්බන්ධ සියළුම සේවකයින්ට, ස්වේච්ඡා සේවකයින්ට, ළමයින්ට සහ පුද්ගලයින්ට අදාළ වේ.

## ආරක්ෂාව සහ සහභාගීත්වය සඳහා වන ළමා අයිතිවාසිකම්

පැෆ්රල් සංවිධානයේ සේවකයින් සහ ස්වේච්ඡා සේවකයින් විසින් විශේෂයෙන්ම ළමයින්ට සෘජුවම බලපාන කරුණු පිළිබඳව ස්වකීය අදහස් ප්‍රකාශ කිරීමට සහ යෝජනා ඉදිරිපත් කිරීමට ළමයින් දිරිමත් කරනු ලැබේ . අපගේ සේවාවන්වලට සහභාගී වන සියලුම ළමයින් ඔවුන්ට වැදගත් වන දේවල් පිළිබඳව 'අදහස් දැක්වීම' සඳහා අපි ඔවුන් ක්‍රියාකාරීව දිරිමත් කරමු. අප විවිධත්වය අගය කරන අතර කිසිවෙකුට අසාධාරණ හේතු මත වෙනස් ලෙස සැලකීමේ ක්‍රියාවන් අනුමත කරන්නේ නැත.

## සේවකයින් සහ ස්වේච්ඡා සේවකයින් බඳවා ගැනීම

පැෆ්රල් සංවිධානය සේවකයින් හා ස්වේච්ඡා සේවකයින් බඳවා ගැනීමේදී හා ඔවුන් තෝරාගැනීමේ පරීක්ෂණවලට ලක් කිරීමේදී screening ළමයින් සම්බන්ධ ක්‍රියාකාරකම්වලට අදාළ චර්යාධර්ම පද්ධතියට අනුකූලව කටයුතු කරනු ලැබේ.

## සේවකයින්ට සහ ස්වේච්ඡා සේවකයින්ට ලබා දෙන සහයෝගය

ළමයින් සම්බන්ධව කටයුතු කිරීමේදී කළමනාකරණයට, සේවකයින්ට ,ස්වේච්ඡා සේවකයින්ට සහ සියලුම අභ්‍යාසලාභීන්ට මග පෙන්වීම සඳහා සහ ඔවුන් විසින් අනුගමනය කළ යුතු පැෆරල් සංවිධානය විසින් සකස් කරන ලද ආචාර ධර්ම පද්ධතිය මීට අමුණා ඇත.

## චර්යාධර්ම පද්ධතිය - code of behavior

වයස අවුරුදු 18 ට අඩු ළමුන් සහ තරුණයින් සම්බන්ධ ක්‍රියාකාරකම් සඳහා වගකිව යුතු අපගේ සේවකයින්ට සහ ස්වේච්ඡා සේවකයන්ට මඟ පෙන්වීම සඳහා පැෆ්රල් සංවිධානය පහත සඳහන් චර්යාධර්ම පද්ධතිය (code of behavior) අනුමත කරයි. මෙම චර්යාධර්ම පද්ධතිය ළමයින් ආරක්ෂා කිරීමට සහ ඔවුන් අපයෝජනයට හෝ හානියට ලක්වීමට (ශාරීරික, මානසික හෝ චිත්තවේගී වශයෙන්) ඇති ඉඩ කඩ අවම කිරීමට උපකාරී වේ. එමගින් පැෆ්රල් සංවිධානයේ සේවා පරිසරය තුළ සහ එහි ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ පරිසරය තුළ ළමයින් සඳහා ආරක්ෂිත අවකාශයක් නිර්මාණය කිරීම එහි අරමුණ වේ. ආයතනයේ කළමනාකරණය, සේවකයින් සහ ස්වේච්ඡා සේවකයින් සියලු දෙනා මෙම චර්යාධර්ම පද්ධතියට අනුකූලව ක්‍රියා කිරීමට එකඟ වේ.

### ඒ අනුව කළමනාකරණය විසින් පහත දැක්වෙන කරුණු ක්‍රියාත්මක කරනු ඇත:

1. සියළුම සේවකයින්ට, ස්වේච්ඡා සේවකයින්ට, ළමයින්ට, තරුණයින්ට සහ ඔවුන්ගේ පවුල්වල අයට ළමා ආරක්ෂාවට අදාළ කරුණු සම්බන්ධ තොරතුරු සහ සහයෝගය ලබා දීම සඳහා නිලධාරියෙකු නම් කිරීම. ( මේ සඳහා කළමනාකරණ කමිටුව විසින් ජ්‍යෙෂ්ඨ කළමනාකරණ නිලධාරියෙක් පත්කරනු ලැබේ ).
2. ළමයින් පූර්ණ අයිතිවාසිකම් හිමි පුද්ගලයින් ලෙස පිළිගැනීම.
3. ළමයින්ට සහ තරුණයින්ට ඔවුන්ගේ ගැටලු පිළිබඳව අන් අය සමග කථා කිරීමට ප්‍රවේශයක් ලබා දීම.
4. බාහිර හෝ අභ්‍යන්තර පුද්ගල සම්බන්ධතාවලදී සැමවිටම එකිනෙකාට ගෞරවාන්විතව කටයුතු කළ යුතු බව ;
5. තමන් අකමැති ආකල්ප සහ හැසිරීම් රටා පැකිලීමකින් තොරව නිදහසේ ප්‍රකාශ කිරීම සඳහා තරුණයන් හා වැඩිහිටියන් දිරිමත් කිරීම ;
6. ළමයකු කිසි විටෙක අපයෝජනයට ලක්වීමේ අවදානමකට ලක් වීමට ඉඩ නොතැබීම හෝ එවැනි ක්‍රියාවලට සමාව නොදීම ;
7. ළමයින්ට අවදානමක් ඇති විය හැකි අවස්ථා පිළිබඳ දැනුවත් වී එවැනි අවස්ථා මැනවින් කළමනාකරණය කිරීම ;
8. ළමයින්ට සහ ඔවුන්ගේ යහපැවැත්මට ඇති අවදානම අවම කිරීම අරමුණු කර ගත් වැඩ සටහන් සැලසුම් කර සංවිධානය කිරීම ;
9. ළමා අපයෝජන සිදුවීම් සුළු කොට තැකීමෙන් හෝ අතිශයෝක්තියට නැංවීමෙන් වැළකී සිටීම ;

10. ළමයින් සම්බන්ධ වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේදී ආරම්භයේදීම මෙම චර්යාධර්ම පද්ධතියට අදාළ සියළුම භාෂාවලින් බෙදා හැරීම සහ ළමා ආරක්ෂාවේ වැදගත්කම පිළිබඳව දැනුවත් වීමේ අවශ්‍යතාවය අවධාරණය කිරීම.

**සේවකයින් සහ ස්වේච්ඡා සේවකයන් විසින් පහත දැක්වෙන කරුණු ක්‍රියාත්මක කරනු ඇත:**

1. ළමා වැඩ සටහන් ක්‍රියාත්මක කිරීමේදී ළමා ආරක්ෂිත පරිසරයක් ස්ථාපිත කර පවත්වා ගෙන යාම (උදා: පැෆ්රල් සංවිධානයේ අරමුණ හා පරමාර්ත සම්බන්ධ කටයුතු සිදු කිරීමේදී).

2. ළමයින් හා තරුණයින් සඳහා ආරක්ෂිත පරිසරයක් පවත්වා ගැනීම.

3. පැෆ්රල් සංවිධානයේ ක්‍රියාකාරකම් සිදු කිරීමේදී එහි නීති රෙගුලාසි හා ප්‍රතිපත්තිවලට අනුකූලව ක්‍රියා කිරීම.

4. සියලුම අවස්ථාවලදී ප්‍රවේශම්වීමේ අවශ්‍යතාවය මැනවින් අවබෝධ කර ගැනීම .

5. කවර හෝ ආකාරයක කායික හෝ මානසික හිංසනය හා ළමා අපයෝජනවලින් වැළකීම.

6. ළමයකු සමඟ තනිව/ හුදකලාව කාලය ගත කිරීමෙන් වැළකීම - ක්‍රියාකාරකම් සැලසුම් කිරීමේදී එක් අයෙකුට වඩා වැඩි පිරිසක් සිටින හෝ අවම වශයෙන් ඇසි දිසි මානයේ වෙනත් පුද්ගලයින් ගැවසෙන ස්ථානයක එම කටයුතු සිදුකිරීම .

7. ළමයින් සමඟ නොගැළපෙන/ අනවශ්‍ය ශාරීරික හෝ වාචික සම්බන්ධතා පැවැත්වීමෙන් වැළකීම.

8. ආරක්ෂක හේතූන් මත නොවැළැක්විය අවස්ථාවක දී මිස කෙටි දුර ගමන් සඳහා වුවද ළමයින්ව වාහනයක තනිවම රැගෙන නොයාම. (එසේ කිරීම නොවැළැක්විය හැකි නම්, ඒ ගැන වැඩිහිටි අරක්ෂකයකු හෝ වෙනත් කාර්ය මණ්ඩල සාමාජිකයෙකු දැනුවත් කිරීමට වග බලා ගැනීම )

9. කේන්තිය ප්‍රදශර්නය කිරීම හෝ සෙනෙහස පෑම වැනි අවධානය යොමු කර ගැනීමේ නුසුදුසු හැසිරීම්වලට යොමු වීමෙන් වැළකීසිටීම ;

10. ඔබේ ආරක්ෂාව සඳහා ඔබේ හොඳ නම මතම පමණක් විශ්වාසය නොතබන්න .

11. ළමයින් ලජ්ජාවට හා නින්දාවට පත්කිරීම, ඔවුන් පහත් කොට සැලකීමේ අදහසින් විවේචනය කිරීම , උපහාසය දනවන වචන හෝ වෙනත් නිෂේධාත්මක වචන හෝ අභිනයන් භාවිතා කිරීමෙන් වැළකීම .

12. ළමයින්ට සහ තරුණයින්ට ගෞරවයෙන් සැලකීම , ඔවුන්ගේ අදහස් හා මතවලට සවන් දී ඒවා අගය කරමින් ඔවුන්ගේ යහපැවැත්ම ආරක්ෂා කිරීමට දායක වීම ;

13. ක්‍රියාකාරකම් සිදු කිරීමේදී ඊට යෝග්‍ය මනෝඥ භාෂා ව්‍යවහාරය , ඉදිරිපත්වීම , හැසිරීම් විලාසය සහ නියමිත වෙලාවට වැඩ කිරීම තුළින් වෘත්තීයභාවය පවත්වා ගැනීම.

14. හැම විටම මැදිහත් ආකල්පයකින් හා අපක්ෂපාතිව කටයුතු කිරීම

15. ළමයින් සහ ඔවුන්ගේ පවුල්වල පෞද්ගලිකත්වයට ගරු කරන අතර ඔවුන් පිළිබඳ තොරතුරු දැන ගතයුතු පුද්ගලයින්ට හැර වෙනත් කිසිවෙකුට හෙළි නොකිරීම .

16. ගැටුම් විසඳීම සාධාරණව හා කඩිනමින් සිදු කිරීම සහ ඒ පිළිබඳව අදාළ පාර්ශවයන්ට වාර්තා කිරීම සහ හැසිරීමට අදාළ මෙම ප්‍රමිතීන්වල කිසියම් උල්ලංඝනයක් වෙතොත් ඒ සම්බන්ධයෙන් ස්ථාපිත ක්‍රියා පටිපාටියට අනුකූලව කටයුතු කිරීම.